සුනාමි යාන්ත්‍රණය
ඇත්ත කියන්නේ කවු ද?

ජනාධිපතිනිය සුනාමි යාන්ත්‍රණයට එකඟත්වය පළ කළා ය. ගිවිසුමට අත්සන් කළා ය. ඇය කියන විදිහට මෙය මෙහෙවින් අලංකෘත කටයුත්තකි. සුනාමියෙන් විපතට පත් උතුර නැගෙනහිර දෙමළ මුස්ලිම් සිංහල ජනතාවට සහන සලසන උදාරතර මෙහෙවරකි. එහෙත්, ජවිපෙ හෙළ උරුමය වැනි පක්ෂ පමණක් නොව, කොටින්ට එරෙහි දෙමළ පක්ෂ හා මුස්ලිම් පක්ෂ ද මෙය හෙළා දකියි. ඔවුන් කියන්නේ මෙය උතුර නැගෙනහිර දෙපළාත කොටින්ට උකස් කිරීමක් බව ය. ඇත්ත කියන්නේ කවු ද? සුනාමි යාන්ත්‍රණයට අත්සන් තබා සතියක් ගෙවී යන්නටත් මත්තෙන් සිදුවන්නට යන දේ පෙනෙන්නට පටන්ගෙන තිබේ.

සුනාමි යාන්ත්‍රණය මඟින් උතුර නැගෙනහිර දෙපළාතේ මුහුදේ සිට රට ඇතුළට කිලෝ මීටර් දෙකක දුරක පිහිටි සියලු ප්‍රතිසංස්කරණ කටයුතු ඉදිකිරීම් ක්‍රියාත්මක කිරීමේ බලය යාන්ත්‍රණ ව්‍යුහයට පවරා ඇත. යාන්ත්‍රණ ව්‍යුහය යනු කොටින්ගේ ලැකඩයක් බව මේ වන විට තහවුරු වී තිබේ. ඒ අනුව අදාළ සීමාවේ පිහිටි ක්‍රියාණමල වරාය, හඹලා කඳවුරු, නාවික හමුදා කඳවුරු ආදී සියලු ආයතනවල ප්‍රතිසංස්කරණ, ඉදිකිරීම් ආදිය ක්‍රියාත්මක කළ යුත්තේ ද යාන්ත්‍රණ ව්‍යුහයේ අනුමැතිය ඇතිව ය. සරලව කියතොත් මින් ඉදිරියට උතුර නැගෙනහිර මුහුද ආසන්නයේ පිහිටි හමුදා කඳවුරක අලුත්වැඩියාවක් කිරීමේ දී ද කිලිනොච්චියෙන් අවසර ගැනීමට සිදුවනු ඇත.

මෙය නිකමම නිකම් ප්‍රකාශයක් නොවේ. කොටි දන් මෙය තමන්ගේ දර්ශනයක් කොට ගෙන තිබේ. කොටි හිතවාදීනු උතුර නැගෙනහි පෙළපාලි යන්නට පටන්ගෙන සිටිති. උද්ඝෝෂණය කරති. ඔවුහු කියන්නේ උතුර නැගෙනහිර මුහුදේ සිට කිලෝ මීටර් දෙකක දුර තමන්ට අයිති බව ය. එය තමන්ගේ පාලනය යටතේ ක්‍රියාත්මක වන බව ය. එය සුනාමි ඒකාබද්ධ යාන්ත්‍රණය නම් ලියවිල්ල හරහා තමන්ට නීත්‍යානුකූලව ලැබී ඇති බව ඔවුහු කියති. එබැවින් දැන් උතුර නැගෙනහිර මුහුද ආසන්නයේ පවතින සියලු හමුදා කඳවුරු ඉවත් කර ගත යුතු බව මෙම කොටි ආධාරකරුවෝ කියා සිටිති. එය නොතරන්නේ නම් ජාත්‍යන්තර ප්‍රජාව හමුවේ කරුණු කියා තම අරමුණ ඉටුකර ගැනීමට පියවර ගන්නා බව ද ඔවුහු කියති. යාන්ත්‍රණය අත්සන් කර සතියක් යද්දී තත්වය මෙසේ නම් ඉදිරියට මොනවා වෙයි ද?

පසුගිය දා වැලිකන්ද බෝවත්ත ප්‍රදේශයේ දී කොටි සාමාජිකයන් රැගත් බස් රථයක් ක්ලේමෝ බෝම්බ ප්‍රහාරයකට ගොදුරු විය. වව්නියාවේ සිට මඩකලපුව බලා ගමන් කරමින් තිබූ කොටි සාමාජිකයන් රැගත් බස් රථ ප්‍රහාරය එල්ල වූ වැලිකන්ද බෝවත්ත මෙන් ම සෙසු රජයේ පාලන ප්‍රදේශ හරහා ගමන් ගන්නා විට දී ද ඉදිරියෙන් හා පසුපසින් සන්නද්ධ හමුදා රථ යොදා ආරක්ෂාව ලබා දී තිබිණ. කෙසේ වෙතත් කරුණා පර්ශවය මඟින් වැලිකන්ද බෝවත්ත ප්‍රදේශයේ දී ආරක්ෂක අංශවල ඇස් වසා අදාළ බෝම්බය අටවා තිබිණ. කොටින්ගේ කුමක්දෝ වාසනාවකට එය නිසි පරිදි ඉලක්ක ගත වූයේ නැත. කෙසේ වෙතත් පිපිරීමෙන් බස් රථයෙන් ගමන් කරමින් සිටි එක් කොටි සාමාජිකාවක මිය ගියා ය. එම සිද්ධිය එතනින් කෙළවර විය. එහෙත් දැන් කොටි එම සිද්ධිය පදනම් කරගෙන අලුත් නාඩගමක සැරසෙති. ඒ සඳහා ඔවුන්ගේ ගෝලයන් බඳුව සිටින සටන් විරාම නිරීක්ෂකයන්ගෙන් ද සැඟෙන සාගෝගයක් ලැබී තිබේ.

පසුගිය ජූනි 28 වනදා මඩකලපුවේ සිට අම්පාර දක්ෂා රජයේ පාලන ප්‍රදේශ ඔස්සේ සටන් විරාම ගිවිසුමට අනුව කොටි සාමාජිකයන් 15 දෙනක් ගමන් කිරීමට සූදානම් වූහ. බස් රථයකින් ඔවුන්ගේ ගමන පිටත් වීමට නියමිතව තිබූ අතර ආරක්ෂාව සඳහා ඉදිරියෙන් හා පසුපසින් පොලිස් විශේෂ කාර්ය බලකා රථ දෙකක් ගමන් කරවීමට සැලසුම් කර තිබිණ.

ගමන පිටත් වීමට මොහොතකට පෙර සිද්ධිය නිරීක්ෂණය බාරව සිටි සටන් විරාම කමිටු නිරීක්ෂකයා පොලිස් විශේෂ කාර්ය බලකායෙන් විශේෂ ඉල්ලීමක් කළේ ය. ඔහු කියා සිටියේ කොටි සාමාජිකයන් ගමන් ගන්නා බස් රථයට විශේෂ කාර්ය බලකා භටයන් කීප දෙනෙක් ද ගොඩ වීය යුතු බව ය. එහි අරමුණ කුමක්දැයි විශේෂ කාර්ය බලකායට ක්ෂණික වැටහිණ. විශේෂ කාර්ය බලකා භටහන් බස් රථයට ගොඩවීම හරහා කරුණා පාර්ශවයේ ප්‍රහාරයක් ඊට එල්ලවීමට ඇති හැකියාව වලක්වා ගැනීමට හැකිවනු ඇතැයි යන්න කොටින්ගේ අදහස්කාර විය. සටන් විරාම නිරීක්ෂකයන් හරහා ඉදිරිපත් වන කොටින්ගේ ඉල්ලීමේ යටිකුටිටු අරමුණු තේරුම් ගත් පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීහු එම ඉල්ලීම ප්‍රතික්ෂේප කළහ. එහෙත් සටන් විරාම නිරීක්ෂකයන්ගේ ඇවටිල්ල නතර වූයේ නැත. අවසානයේ එම ස්ථානයේ සිටි පොලිස් විශේෂ කාර්ය බලකායේ ප්‍රධාන නිලධාරියෙකුගේ කොන්දේ නැමිණ. කොටි සාමාජිකයන් ගමන් කරන බස් රථයට විශේෂ කාර්ය බලකා සෙබළුන් කීප දෙනෙක් ද ගොඩ වූහ. කොටි කරුණා පාර්ශවයට මුහුණ දීම සඳහා විශේෂ කාර්ය බලකාය පළිහක් ලෙස භාවිතා කළේ ඒ අන්දමට ය. මෙම තත්වයන්ගේ කෙළවර කොතැන ද? අද අපට සිදුව ඇත්තේ කොටින්ට ආරක්ෂාව ලබා දීමට දැයි ආරක්ෂක අංශ සාමාජිකයෙක් ප්‍රශ්න කරන්නට පටන් ගෙන සිටිති.

කොටි තුවක්කුකරුවෝ කොළඹ දී යුධ හමුදා පළමුවන සන්නද්ධ බුද්ධි බලකායේ අණදෙන නිලධාරියාව සිටි ලුතිනන් කර්නල් තුවාන් නිශාම් මුතාලිෆ් සාතනය කළ අයුරු අපි පසුගිය

රියල් අද්මිරාල් සරත් වීරසේකර යනු ශ්‍රී ලංකා නාවික හමුදාවේ ජ්‍යෙෂ්ඨතම නිලධාරියෙකි. කොටින්ට එරෙහිව දරුණු සටන් කීපයක් මෙහෙයවා ඇති ඔහු එජාප රජය සමයේ සටන් විරාමය ක්‍රියාත්මකව තිබිද්දීත් කොටි ආයුධ නාවි විනාශ කිරීමට අණ දුන් නිලධාරියකු ලෙස ඉතිහාසයට එක්වූවෙකි. එහෙත් පසුගිය දා ඔහුට හදිසි මාරුවක් ලැබිණ.

ආරක්ෂාව

කලාපයේ දී සටහන් කළෙමු. මෙවර කලාපයේ ද අපට බුද්ධි අංශ නිලධාරීන්ගේ මරණ ගැන කණගාටුවෙන් වුව ද සටහන් කරන්නට සිදුවී තිබේ. ජාතික රහස් තොරතුරු කාර්යාංශයේ සේවය කළ පොලිස් සැරයන්වරයෙකු වූ මුතුබණ්ඩා කොටි පිස්තෝලකරුවන්ට ගොදුරු විය. මහ දවල් සේරුනුවර පොලිසියට මීටර් 10 ක් පමණ ආසන්නයේ සැරයන් මුතුබණ්ඩා ඝාතනයට ලක් වීම ගැන සාමය වෙනුවෙන් කතා කරන කිසිවෙකුත් කතා කරන්නේ නැත. සාම එන්ජිමිකාරයන් මේවා ගැන කියන්නේ මේවා කළේ කොටින් ම කියා කියන්නේ කොහොමදැයි කියාය. කොටින්ගේ හොඳකම් ගැන කියන ආණ්ඩුවේ පිරිස්වලට ද විපක්ෂයේ පිරිස්වලට ද මේවා පෙනෙන්නේ නැත. මේ අතර ඊපීඩීපී සාමාජිකයන් පිරිසකගේ ආරක්ෂාවට යමින් සිටිය දී මඩකලපුව ප්‍රදේශයේ දී කොටි ප්‍රහාරයකට ලක්ව තුවාල ලබා සිටි හමුදා සොල්දාදුවෙක් ද ඉකුත් දා මිය ගියේ ය. මේවා නිකමම නිකම් ප්‍රවෘත්තිවලට පමණක් සීමා වන අතර එතැනින් එහාට ඒවා වැළැක්වීමට හෝ වෙනයම් පියවරක් ගැනීමට හෝ ක්‍රියාමාර්ගයක් ගැනෙන්නේ නැත. රියල් අද්මිරාල් සරත් වීරසේකර යනු ශ්‍රී ලංකා නාවික හමුදාවේ ජ්‍යෙෂ්ඨතම නිලධාරියෙකි. කොටින්ට එරෙහිව දරුණු සටන් කීපයක් මෙහෙයවා ඇති ඔහු එජාප රජය සමයේ සටන් විරාමය ක්‍රියාත්මකව තිබිද්දීත් කොටි ආයුධ නැව් විනාශ කිරීමට අණ දුන් නිලධාරියකු ලෙස ඉතිහාසයට එක්වූවෙකි. එහෙත් පසුගිය දා ඔහුට හදිසි මාරුවක් ලැබිණ. නැගෙනහිර නාවික ආඥාපතිව සිටි ඔහුව නාවික හමුදාවේ නව තනතුරක් ඇතිකොට එයට මාරුකර යැවීමට ආරක්ෂක අමාත්‍යංශය පියවර ගෙන තිබේ. මෙය නාවික හමුදාපතිවරයාට ද නොදන්වා ජනාධිපතිතිය හා ඇගේ හිතවත් පිරිසකගේ වුවමනාව මත කළ එක්ක බවට අදහස් පලව තිබේ. මෙම ස්ථාන මාරුවට ආසන්නම හේතුව ලෙස සැලකෙන්නේ ත්‍රිකුණාමලය බුදුපිළිම ප්‍රශ්නයේ දී එය ඉවත් නොකරීමට කතා කළ පිරිස අතර රියල් අද්මිරාල් වීරසේකර ද වූ නිසා බව කියැවේ. මේ බව දෙමළ සන්ධානයේ පාර්ලිමේන්තු මන්ත්‍රී ආර්.සම්බන්ධන් මහතා එක දෙක කොට ජනාධිපතිනියට පැමිණිලි කොට ඇති බවත්, අනතුරුව සාමයට බාධා වනවා යැයි චෝදනාව යටතේ මේ මාරුව සිදුකොට ඇති බවත් ආරක්ෂක අංශ අතර කතාබහට ලක්ව තිබේ. මෙම තීරණය දේශයට හිතැතිව තම රාජකාරිය ඉටුකරන ආරක්ෂක අංශ නිලධාරීන්ගේ කනස්සල්ලට හේතු වී ඇති අතර ඉදිරියේ දී තමන් කටයුතු කළ යුත්තේ කෙසේදැයි යන බරපතල ප්‍රශ්නයකට ඔවුහු මැදිව සිටිති. සමස්ථයක් ලෙස ගත් කළ පසුගිය මාසය පුරා සිදුවී ඇත්තේ ජාතික ආරක්ෂාව බිඳෙන් බිඳ පාලට තල්ලු වීම ය. කොටි ශක්තිමත් වීම ය. හැමදාමත් සිදුව ඇත්තේ මෙයම ය. එබැවින් අපට හැමදාමත් කියන්නට සිදුව ඇත්තේ ද මේ ගැනම ය. අවාසනාවකට මේ සමීකරණය වෙනස්වන පාටක් පෙනෙන්නට නැත. එය වෙනස් කොට රට ඇංක 10 තබා වැඩ කරන දේශපාලන නායකත්වයක් බිහිවන තුරා අපට හැමදාමත් කියන්නට සිදුවනු ඇත්තේ මෙවැනි කාරණා ගැනම ය. ■